කෘෂිකර්ම අමාත්‍යාංශය ලෙස පහත සඳහන් ක්ෂේත්‍ර 5 වෙනුවෙන් කරනු ලබන කාර්ය භාරය -2018

## 1. තිරසාර සංවර්ධන දර්ශක

| දර්ශකය | කරනු ලබන ව්‍යාපෘති | අපේක්ෂිත ප්‍රතිඵල |
|---|---|---|
| 1. සියළු ආකාරයේ දිළිඳු බව, සියළු තැන්හිම දුරු කිරීම   | – ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන<br>– කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන | • දේශීය ආහාර භෝග නිෂ්පාදනය වැඩිවීම.<br>• ආනයනික වියදම් අඩුවීම.<br>• ආදායම් වැඩි වීම හා දරිද්‍රතාව අවම වීම. |
| 2. කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණයක් අත්පත් කරගැනීම සහ තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.   | – ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන<br>– යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරීම.<br>– කෘෂිකාර්මික පර්යේෂණ හා තාක්ෂණ සංවර්ධනය<br>– රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය තුළින් තිරසාර කෘෂිකර්මාන්තය තහවුරු කිරීම.<br>– කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන සහ "සාර ලංකා" ණය යෝජනා ක්‍රමය.<br>– කෘෂි බෝග නිෂ්පාදන හා පුරෝකථන වැඩසටහන<br>– ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම විශ්ව විද්‍යාල සමඟ ක්‍රියාත්මක කිරීම (NARP)<br>– පලතුරු ගම්මාන වැඩසටහන<br>– ගෙවතු වගා ප්‍රවර්ධන වැඩසටහන | • යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම මඟින් දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි ආහාරවලින් රට ස්වයංපෝෂණය කිරීම සහ එම ආහාර ආනයනය සඳහා වැය වන විදේශ විනිමය නතර කිරීම<br>• නීරෝගී පරපුරක් බිහි කිරීම සඳහා සෞඛ්‍යාරක්ෂිත ආහාර නිපදවීම<br>• යාන්ත්‍රීකරණය හා නව තාක්ෂණික හා කෘෂිකාර්මික ක්‍රම හඳුන්වාදීම තුළින් බෝග නිෂ්පාදනය හා ඵලදායීතාවය ඉහළ නැංවීම<br>• රට තුළ පරිභෝජනය සඳහා පලතුරු සුලභ කිරීම.<br>• ගෙවතු වගාව හා පළතුරු ගම්මාන වැඩසටහන තුළ පවතින භෝග විවිධාංගීකරණය මඟින් ග්‍රාමීය ප්‍රෙද්ශ වල ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පොෂණයක් ලැබීම. |

| දර්ශකය | කරනු ලබන ව්‍යාපෘති | අපේක්ෂිත ප්‍රතිඵල |
| --- | --- | --- |
| 3. නිරෝගී ජීවිතයක් තහවුරු කිරීම හා සියලු දෙනාට, සැම වයසකදීම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම<br> | – ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන<br>– යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරීම. (GAP)<br>– පාංශු පරීක්ෂණ වැඩසටහන | • නීරෝගී පරපුරක් බිහි කිරීම සඳහා සෞඛ්‍යාරක්ෂිත ආහාර නිපදවීම<br>• අනවශ්‍ය කෘෂි යෙදවුම් පාලනය තුලින් පසේ හා පාංශු ජලයේ ගුණාත්මක භාවය වැඩි කිරීම.<br>  |
| 4. සමාන හා අන්තර්ග්‍රහණීය (සියලු සමාජ ස්ථරයන්ට අවස්ථාවක් ලැබෙන) වූ අධ්‍යාපනයක් ලැබීම තහවුරු කිරීම හා සැමට ජීවිත කාලය පුරා අධ්‍යාපනය ලැබීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම<br> | – NVQ 5 මට්ටමේ කෘෂිකර්ම ඩිප්ලෝමාධාරින් බිහිකිරිම සඳහා පාඨමාලාවන් ක්‍රියාත්මක කිරිම<br>– කෘෂි ව්‍යාප්තිය හා පුහුණු කිරිම. | • කෘෂිකර්ම ක්ෂේත්‍ර යේ රැකියා අවස්ථා සුලබ කිරිම<br>• නව්‍ය තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම තුළින් ඵලදායිතාව ඉහළ නැංවීම.<br>• ගොවීන් තාක්ෂණිකව දැනුවත් වීම සහ බලගැන්වීම. |

| දර්ශකය | කරනු ලබන ව්‍යාපෘති | අපේක්ෂිත ප්‍රතිඵල |
|---|---|---|
| 5. ස්ත්‍රී පුරුෂ සමාජභාවය අත්කරගැනීම සහ කාන්තාවන් හා ගැහැණු ළමයින් බලගැන්වීම.<br><br> | – සිතමු ගොවි කාන්තා සංවිධාන සමඟ ගෙවතු වගා වැඩ සටහන.<br>– තරුණ සහ කාන්තා සහභාගීත්වය-හෙළ බොජුන්,<br>– කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන සහ "සාර ලංකා" ණය යෝජනා ක්‍රමය. | • කාන්තාව සවිබල ගැන්වීම හා සජීවීකරණය.<br>• කාන්තාවන් සඳහා ස්වයං රැකියා ඇතිකිරීම තුලින් පවුලේ පෝෂණය හා සම්පත් කළමනාකරණය<br>• කාන්තවන්ගේ ආදායම් වැඩිවීම.<br>• කාන්තාවන් අතර සහජීවනය සහ ආර්ථික අවස්ථාවන් ඇති වීම.<br>• කුටුම්භ ආදායම ඉහළ යාම. |
| 6. සැමට ජලය ලැබීම හා තිරසාර ජල කළමනාකරණය හා සනීපාරක්ෂාව ලැබීම තහවුරු කිරීම.<br><br> | – ජලය හා සනීපාරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳව නියාමන ව්‍යාපෘතිය (WASH)<br>– සුළු වාරිමාර්ග සංවර්ධනය<br>– කෘෂි ලිං ඉදි කිරීම සහ අලුත්වැඩියාව<br>– වැසි ජලය කළමණාකරනය සඳහා නව ක්‍රම හඳුන්වා දීම.<br>– අඩු ජල ප්‍රමාණයක් අවශ්‍ය වන නව ප්‍රභේද හඳුන්වා දීම.<br>– පාංශු පරීක්ෂණ වැඩසටහන<br>– යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරීම. | • පාංශු හා ජල සුරක්ෂිතතාවය හා ජලසංරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම<br>• අනවශ්‍ය කෘෂි යෙදවුම් පාලනය තුලින් පසේ හා පාංශු ජලයේ ගුණාත්මක භාවය වැඩි කිරීම<br>• ජල කළමණාකරණය තුලින් නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම. |

| දර්ශකය | කරනු ලබන ව්‍යාපෘති | අපේක්ෂිත ප්‍රතිඵල |
|---|---|---|
| 7. දරාගත හැකි වූ , විශ්වසනීය වූ , තිරසාර හා නූතන බලශක්තිය සඳහා ප්‍රවේශය සැමට තහවුරු කිරීම   | – සූර්ය බල ශක්තියෙන් ජල සම්පාදන ක්‍රම ඇති කිරීම | – බලශක්තිය අවම භාවිතය තුළින් නිෂ්පාදන වියදම අඩු කිරීම හා කාර්යක්ෂම බලශක්ති පරිභෝජනය. |
| 8. දරාගත හැකි, අන්තර්ග්‍රහණීය සහ තිරසාර ආර්ථික වර්ධනයක් සම්පූර්ණ හා ඵලදායී රැකියාවක් හා සැමට ගෞරවාන්විත වෘත්තියක් ලැබීම ප්‍රවර්ධනය කිරීම.   | – NVQ 5 මට්ටමේ කෘෂිකර්ම ඩිප්ලෝමාධාරීන් බිහිකිරීම සඳහා පාඨමාලාවන් ක්‍රියාත්මක කිරීම<br>– කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන සහ "සාර ලංකා" ණය යෝජනා ක්‍රමය.<br>– හෙළ බොජුන් හල් ක්‍රියාත්මක කිරීම තුළින් ගෘහස්ථ කාන්තාවන්ගේ ආර්ථිකය වැඩි දියුණු කිරීම.<br>– පළතුරු හා එළවළු සඳහා අගය දාම ව්‍යාපෘති.<br>– ගොවිපළ යාන්ත්‍රිකරණය | • කෘෂිකර්ම ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා සුලබ කිරීම<br>• නව්‍ය තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම තුළින් ඵලදායිතාව ඉහළ නැංවීම.<br>• කුටුම්භ ආදායම ඉහළ නැංවීම.<br>• කාබනික පොහොර ව්‍යවසායකයින් බිහි කිරීම.<br>• ගෘහස්ථ කසළ කළමණාකරණය.<br>• අපනයන ආදායම ඉහළ නැංවීම.<br>• එළවළු හා පළතුරු හානිය අවම කිරීම. |

| දර්ශකය | කරනු ලබන ව්‍යාපෘති | අපේක්ෂිත ප්‍රතිඵල |
|---|---|---|
| 9. ප්‍රත්‍යස්ථ වූ යටිතල පහසුකම් තැනීම, අන්තර්ග්‍රහණය හා තිරසාර කාර්මීකරණයක් ප්‍රවර්ධනය, නවෝත්පාදනය ධෛර්යමත් කිරීම   | – රාජ්‍ය හා පුද්ගලික හවුල්කාරිත්වය යටතේ උසස් තත්වයේ බීජ නිෂ්පාදන වැඩසටහන<br>– කෘෂිකාර්මික නවීකරණ ව්‍යාපෘතිය.<br>– ගොවිපළ යන්ත්‍ර නිෂ්පාදනය හා පර්යේෂණ සිදු කිරීම. | • නූතන තාක්ෂණය ප්‍රචලිත කිරීම<br>• නිෂ්පාදන එකතු කිරීම සඳහා පුද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම<br>• කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ හැකියාව හා ධාරිතාව ප්‍රවර්ධනය කිරීම.<br>• ගොවිපළ යන්ත්‍ර ව්‍යවසායකයින් ඇතිකිරීම හා ප්‍රවර්ධනය. |
| 10. රටවල් ඇතුළත හා රටවල් අතර ඇති අසමානතාව අඩු කිරීම   | – ජාත්‍යන්තර සංවිධානයන්හී සාමාජිකත්වය දැරීම (APO, ARRDO, CERDAP,FAO, UNDP, IRRI,etc…..) | • අත්දැකීම් හුවමාරු කර ගැනීමේ අවස්ථාවන් ඇතිවීම හා එමඟින් නව තාක්ෂණික දැනුම ලබා ගැනීමේ හැකියාව ඇති වීම.<br>• නව ව්‍යාපෘති හඳුන්වා දීම වෙනුවෙන් මූල්‍යමය දායකත්වය ලැබීම. |
| 11. නගර හා මානව ජනාවාස අන්තර්ග්‍රහණය, ආරක්ෂිත ප්‍රත්‍යස්ථ හා තිරසාර බවට පත් කිරීම.   | – නාගරික කෘෂිකාර්මික වැඩසටහන. | • නාගරික ගෙවතු ඇති කිරීම.<br>• නාගරික පරිසරය හරිතකරණයට ලක්වීම හා පොෂණය ඉහළ යාම. |

| දර්ශකය | කරනු ලබන ව්‍යාපෘති | අපේක්ෂිත ප්‍රතිඵල |
|---|---|---|
| 12. තිරසාර පරිභෝජන හා නිෂ්පාදන රටා තහවුරු කිරීම.<br> | – ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන<br>– යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරීම. (GAP)<br>– පසු අස්වනු තාක්ෂණ වැඩසටහන්<br>– ආහාර ප්‍රවර්ධන වැඩසටහන්<br>– ආහාර සුරක්ෂිත තාව පිළිබඳ වැඩසටහන්. | • පරිභොජන රටාවන් තිරසාර කිරීම<br>• කෘෂි නිෂ්පාදන අපතේ යාම වළක්වාලීම.<br>• සෞඛ්‍ය ආරක්ෂිත ආහාර ප්‍රවර්ධනය කිරීම. |
| 13. දේශගුණික වෙනස්වීම් හා එහි බලපෑම් වැළැක්වීම සඳහා කඩිනම් පියවර ගැනීම.<br> | – ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන<br>– දේශගුණික වෙනස්වීම් හා එහි බලපෑම් වලට අනුවර්තනය වීම සඳහා නව ප්‍රභෙද හා තාක්ෂණය හඳුන්වා දීම.<br>– සුළු වාරිමාර්ග සංවර්ධනය<br>– කෘෂි ලිං අලුත්වැඩියාව.<br>– වැසි ජලය කළමණාකරනය.<br>– පුරන් කුඹුරු වැඩසටහන.<br>– ආරක්ෂිත ගෘහ ඇති කිරීම.<br>– දේශගුණික පුරෝකථන වැඩසටහන්. | • තිරසර ආහාර නිෂ්පාදනය තහවුරු කිරීම<br>• ආහාර සුරක්ෂිත තාව ඇති කිරීම.<br>• ජලය කළමණාකරණය කිරීම.<br>• අස්වනු හානිය අවම කිරීම.<br>• ගොවීන් සඳහා දේශගුණික බලපෑමින් සිදුවන හානිය අවම කිරීම. |
| 14. සාගර, මුහුදු හා සමුද්‍රීය සම්පත් සංරක්ෂණය කිරීම හා තිරසාර සංවර්ධනය සඳහා යොදා ගැනීම.<br> | | |

| දර්ශකය | කරනු ලබන ව්‍යාපෘති | අපේක්ෂිත ප්‍රතිඵල |
|---|---|---|
| 15. භෞමික පරිසර පද්ධති ආරක්ෂා කරගැනීම, ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසාර ආකාරයෙන් කළමනාකරණය කිරීම, කාන්තාරකරණය වැළැක්වීම, භූමි හායනය වළක්වා එය ප්‍රතිවර්තනය කිරීම හා ජෛව විවිධත්වය අහිමි වීම නැවැත්වීම. | – කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන<br>– සුළු වාරිමාර්ග සංවර්ධනය හා පුනරුත්තාපනය<br>– වැව් රොන්මඩ ඉවත් කිරිම<br>– බෝග විවිධාංගීකරණ වැඩසටහන | • කාබනික කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරිම<br>• තිරසර කෘෂිකර්මාන්තය තහවුරු කිරිම<br>• භෞමික පරිසර පද්ධති ආරක්ෂා කරගැනීම<br>• කාන්තාරකණය වැළැක්වීම, භූමි හායනය වළක්වා එය ප්‍රතිවර්තනය කිරීම හා ජෛව විවිධත්වය අහිමි වීම නැවැත්වීම |
| 16. තිරසාර සංවර්ධනය සඳහා වූ සාමකාමී හා අන්තර්ග්‍රහණය වූ සමාජ ප්‍රවර්ධනය හා සැමට සාධාරණය සඳහා ප්‍රවේශය සැපයීම හා වගකීමක් සහිත හා අන්තර්ග්‍රහණය වූ ආයතන සැම මට්ටමකම ස්ථාපිත කිරීම. | – සිතමු ගොවි කාන්තා සංවිධාන වැඩසටහන<br>– ගෙවතු වගා ප්‍රවර්ධන වැඩසටහන<br>– කෘෂිකාර්මික දත්ත පද්ධතිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම. | • නීරෝගී පරපුරක් බිහි කිරීම සඳහා සෞඛ්‍යාරක්ෂිත ආහාර නිපදවීම<br>• කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් පවුලේ පෝෂණය හා සම්පත් කළමනාකරණය.<br>• කෘෂිකර්මයට අදාළ දත්තයන් පහසුවෙන් හා කඩිනමින් ලබා ගත හැකි වීම. |

| දර්ශකය | කරනු ලබන ව්‍යාපෘති | අපේක්ෂිත ප්‍රතිඵල |
|---|---|---|
| 17. තිරසාර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගිතාව ක්‍රියාත්මක කිරීමේ සහ නව ජීවයක් දීමේ මාර්ග ශක්තිමත් කිරීම. | | |

## 2. ආංශික ප්‍රතිසංස්කරණ

| ක්‍රියාකාරකම | ගැටළුව | යෝජනාව |
|---|---|---|
| අනුමත ප්‍රමාණයට වැඩි ප්‍රමාණයක් පොහොර භාවිතා කිරීම. | මෙම හේතුව නිසා පස තුළ බහුලව පොස්ෆරස් (P) සහ පොටෑසියම් (K) එකතුවේ.එය කෘෂිකර්මයට මෙන්ම සමස්ථ පරිසර පද්ධතියටම හානි දායක වන්නකි.උඩරට ප්‍රෙද්ශවල මෙන්ම අනෙකුත් එළවළු වගා කරන ප්‍රදේශ වල මෙම ගැටළුව වැඩිවෙමින් පවතී. | පාංශු පරික්ෂාවක් සිදුකොට වගාවන් සඳහා පොහොර භාවිතා කිරිමට ගොවීන් පෙළඹවිය යුතු අතර එලෙස නොකරන ගොවීන් සඳහා පොහොර නිකුත් නොකිරීමට ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සුදුසු බව යෝජනා කරමු. |

## 3. “ Green “ and “ Blue” ආර්ථික සංකල්ප වල භාවිතය

| ක්ෂෙත්‍ර | කරනු ලබන ව්‍යාපෘති | අපේක්ෂිත ප්‍රතිඵල |
|---|---|---|
| | | |
| ජල කළමණාකරණය | – ජලය හා සනීපාරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳව නියාමන ව්‍යාපෘතිය (WASH)<br>– සුළු වාරිමාර්ග සංවර්ධනය<br>– කෘෂි ළිං අලුත්වැඩියාව<br>– වැසි ජලය කළමණාකරනය<br>– අඩු ජල ප්‍රමාණයක් අවශ්‍ය වන නව ප්‍රභේද හඳුන්වා දීම. | • පාංශු හා ජල සුරක්ෂිතතාවය හා ජලසංරක්ෂණ ක්‍රම හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම<br>• ජලය කාර්යක්ෂම හා ඵලදායි ලෙස කළමණාකරණය කිරීම. |
| අපද්‍රව්‍ය කළමණාකරණය | – කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන.<br>– කාබනික ගොවිතැන ප්‍රචලිත කිරීම. | • නීරෝගී පරපුරක් බිහි කිරීම සඳහා සෞඛ්‍යාරක්ෂිත ආහාර නිපදවීම<br>• තිරසර කෘෂිකර්මාන්තය තහවුරු කිරීම<br>• භෞමික පරිසර පද්ධති ආරක්ෂා කරගැනීම |
| ඉඩම් කළමණාකරණය | – පාංශු පරීක්ෂණ වැඩසටහන<br>– කාබනික වගාව දිරි ගැන්වීම<br>– පුරන් කුඹුරු නැවත අස්වැද්දීමේ වැඩසටහන<br>– බෝග විවිධාංගීකරණ වැඩ සටහන | • නව්‍ය තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම තුළින් ඵලදායිතාව ඉහළ නැංවීම.<br>• වගා බිම් ප්‍රමාණය ඉහළ නැංවීම.<br>• පස සංරක්ෂණය වීම.<br>• නීරෝගී පරපුරක් බිහි කිරීම සඳහා සෞඛ්‍යාරක්ෂිත ආහාර නිපදවීම |

## 4. ජනතාව බල ගැන්වීම

| ක්ෂෙත්‍ර | කරනු ලබන ව්‍යාපෘති | අපේක්ෂිත ප්‍රතිඵල |
|---|---|---|
| | | |
| ජනතාව බල ගැන්වීම | – සිතමු ගොවි කාන්තා සංවිධාන<br>– ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන<br>– කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන ( සාර ලංකා වැඩසටහන)<br>– පලතුරු ගම්මාන වැඩසටහන<br>– ගෙවතු වගා ප්‍රවර්ධන වැඩසටහන<br>– ව්‍යාප්ති හා කෘෂිකාර්මික අංශයට අදාළ පුහුණු වැඩසටහන්<br>– වාණිජ ගොවිපළ වැඩසටහන | • ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම.<br>• භෝග නිෂ්පාදනය වැඩිවීම.<br>• කුටුම්භ ආදායම වැඩිවීම.<br>• කුටුම්භ පරිභෝජන වියදම අඩු වීම.<br>• ආදායම් වැඩි වීම හා දරිද්‍රතාව අවම වීම.<br>• කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් පවුලේ පෝෂණය හා සම්පත් කළමනාකරණය.<br>• නීරෝගී පරපුරක් බිහි කිරීම සඳහා සෞඛ්‍යාරක්ෂිත ආහාර නිපදවීම<br>• තරුණ ගොවි ව්‍යවසායකයන් බිහිවීම. |







## 5ආයෝජන සහ අපනයන

| ක්ෂේත්‍ර | කරනු ලබන ව්‍යාපෘති | අපේක්ෂිත ප්‍රතිඵල |
|---|---|---|
| | | |
| ආයෝජන සහ අපනයන | – ආනයන සහ අපනයනයේදී ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ශාකවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කටුනායක ගුවන්තොටුපලේ පිහිටි ශාක නිරෝධායන ඒකකයේ පහසුකම් වැඩිදියුණු කිරීම.<br>– GAP<br>– ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන<br>– රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘති.<br>– අගයදාම සංවර්ධන ව්‍යාපෘති.<br>උදා:- ඕමාරගොල්ල අඹ ව්‍යාපෘතිය | • ආදායම් වැඩි වීම.<br>• අගය එකතුකළ කෘෂි නිෂ්පාදන අපනයනය මඟින් වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් ලබා ගැනීම.<br>• GAP නිෂ්පාදන සුලභ වීම.<br>• යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරිම මඟින් දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි ආහාරවලින් රට ස්වයංපෝෂණය කිරීම සහ එම ආහාර ආනයනය සඳහා වැය වන විදේශ විනිමය අවම කිරිම. |

සකස් කිරීම
එච්.එල්.සී.එන්.සෙව්වන්දි
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
කෘෂිකර්ම අමාත්‍යාංශය

උපදෙස් - ඩබ්.ඩබ්.එස් මංගල
අධ්‍යක්ෂ සැලසුම්
කෘෂිකර්ම අමාත්‍යාංශය